# Abstract No 71

# බ්‍රාහ්මණ මතවාදයන්හි අර්ථ ශුන්‍ය බව සංස්කෘත නාට්‍ය මඟින් ප්‍රතිබිම්බනය වන ආකාරය පිළිබඳ අධ්‍යයනයක්.

**එස්.පී. ගයානි මධූෂා කුමාරි**
විශේෂවේදී දෙවන වසර, සිංහල අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය
madhusha2831@gmail.com

භාරතීය ජනසමාජයේ ආගම, සංස්කෘතිය, රාජ්‍යපාලනය, ආර්ථිකය, අධ්‍යාපනය, භාෂාව හා සාහිත්‍යය ආදි අංශ ගණනාවක් ම ගොඩනැගුණේ බ්‍රාහ්මණ මතවාද හා ඉගැන්වීම් කරණ කොටගෙන ය. සමාජස්තරයේ ඉහළ ම ස්ථානය උසුලමින් සෙසු ජනයා පීඩනයට පත් කරමින් තමාගේ සුබෝපභෝගී බව උදෙසා අර්ථ ශූන්‍ය මතවාද ඉදිරිපත් කරන්නට බ්‍රාහ්මණයෝ උත්සුක වූහ. ලෞකික අනුභූතීන් පාදක කර ගනිමින් නිර්මාණය වූ සංස්කෘත නාට්‍ය මඟින් විවිධ රසභාව ප්‍රේක්ෂකයා විෂයෙහි ඇති කරනු ලබයි. මෙහි දී අවධානය යොමුවනුයේ ශෘංගාර, හාස්‍ය යනාදි රස භාව ජනනය කිරීමට අමතර ව කතාපුවත හා සම්බන්ධ වූ චරිත අවස්ථා සිදුවීම් මාර්ගයෙන් බ්‍රාහ්මණ මතවාදයන්හි අර්ථ ශූන්‍ය බව ද ප්‍රකට වන ආකාරය අධ්‍යයනය කිරීම යි. පර්යේෂණයේ සීමාකර ගැනීම් වශයෙන් හර්ෂදේව රජුගේ රත්නාවලී නාට්‍යය හා ශූද්‍රකගේ මෘච්ඡකටික නාට්‍යය යන සංස්කෘත නාට්‍යද්වය පිළිබඳ පමණක් අධ්‍යයනය කෙරේ. පර්යේෂණ මාතෘකාව හා සම්බන්ධ ව ලියැ වී ඇති ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය මත පදනම් ව කෙරෙන මෙම අධ්‍යයනයේ දී බ්‍රාහ්මණ මතවාදයන්හි අර්ථ ශූන්‍ය බව සංස්කෘත නාට්‍ය මඟින් ප්‍රතිබිම්බනය වන ආකාරය විමර්ශනයට ලක් කෙරෙයි. හාස්‍ය රසය හා උපහාස රසය ජනනය කිරීම අරමුණු කර ගනිමින් සෑම සංස්කෘත නාට්‍යයක ම පාහේ උපයුක්ත වන චරිතයක් ලෙස විදූෂක චරිතය හැඳින්විය හැකි ය. එකී චරිතය මඟින් බ්‍රාහ්මණ ජන සමාජයේ මුග්ධ බව හා පුහු ආටෝපකාරී මාන්නාධික චරිත ස්වභාවය නිරූපණය වේ. ස්ත්‍රිය පිළිබඳ බ්‍රාහ්මණයින් විසින් ඉදිරිපත් කරන ලද මතවාද නිශේධනය වන අයුරින් උක්ත නාට්‍ය දෙකෙහි ම අවස්ථා සිද්ධි නිරූපණය සිදු වී ඇත. ඒ අනුව බ්‍රාහ්මණ මතවාදයන්හි අර්ථ ශූන්‍ය බව සංස්කෘත නාට්‍ය මඟින් ප්‍රතිබිම්බනය වන බව නිගමනය කළ හැකි ය.

**ප්‍රමුඛපද :-** සංස්කෘත නාට්‍ය, රත්නාවලීනාටිකාව, මැටිකරත්තයනාට්‍යය, බ්‍රාහ්මණමතවාද, භාරතීයජනසමාජය.